# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலகக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2021.06. 21 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් තුළ සියළුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

<u>සමූපකාර සේවක දත්ත රැස්කිරීම</u>.

දකුණු පළාත තුළ ස්ථිර,කොන්ත්‍රාත් හා තාවකාලික පදනමින් සේවය කරන සියලුම සමුපකාර සේවකයන්ගේ දත්ත යාවත්කාලීන කිරීමේ අරමුණින් සමූපකාර සේවක දත්ත යාවත්කාලීන කිරීම සඳහා (google form) ගූගල් ෆෝරමයක් අප කාර්යාලයේ වෙබ් පිටුවට උඩුගත කර (upload) ඇත.

02. මෙම කාර්යාලයේ අන්තර්ජාල පිටුවට <u>http://cec.sp.gov.lk/</u> ලිපිනය මගින් සම්බන්ධ වී අදාල සේවකයාටම ඉහත ආකෘතිය පුරවා අප වෙත යොමු කිරීමේ හැකියාව ඇත. වෙබ් පිටුවෙහි ඇති අදාල link එක මත click කිරීමෙන් අදාල ෆෝරමය විවෘත කර ගත හැකි අතර, එය පිටු හතරකින් සමන්විත වේ. එක් එක් පිටුවක් සම්පූර්ණ කර අවසන් වීමෙන් අනතුරුව Next යන්න භාවිතා කර ඊළඟ පිටුවට පිවිසිය හැකි අතර, අවසන් පිටුවෙහි අවසන ඇති Submit යන විධානය ලබාදුන් පසු අදාල තොරතුරු අප වෙත ස්වයංක්‍රීයව යොමු වේ.

03. දැනට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිරිස්බල තක්සේරුව අනුමත කළ/නොකළ සියලුම සමිතිවල සේවක සේවිකාවන්ට මෙම ෆෝරමය පුරවා අප වෙත යොමු කරන ලෙස දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි. මෙම ෆෝරමය පිරවීම සඳහා අදාල සේවකයා මෙම කොමිෂන් සභාවේ අනුමතවීම අවශ්‍ය නොවන බව ද දන්වමි.

04. ඒ අනුව මේ සම්බන්ධව ඔබ සමිතියේ/සමිති සංගමයේ සියලුම සේවක සේවිකාවන් දැනුවත් කර, 2021 ජූලි මස 31 දිනට පෙර අදාල ෆෝරමය පුරවා අප වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

05. සියලු සේවකයන්ගේ තොරතුරු අප වෙත ලැබීමෙන් අනතුරුව ඒවායේ නිරවද්‍යතාවය ඔබ මගින් තහවුරු කරගැනීමට ක්‍රමවේදයක් සකස් කර ඇති බවද කාරුණිකව දන්වමි.

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත